# ද්වාදසමො පාඨො

# මහාබොධිපතිට්ඨාපනං

දෙවානම්පියතිස්සමහාරාජාපි උත්තරද්වාරතො පට්ඨාය යාව ජම්බුකොලපට්ටනා මග්ගං සොධාපෙත්වා අලංකාරාපෙත්වා නගරතො නික්ඛමනදිවසෙ උත්තරද්වාරසමීපෙ සමුද්දසාලාවත්ථුස්මිං ඨිතො තාය විභූතියා මහාසමුද්දෙ ආගච්ඡන්තං යෙව මහාබොධිං ථෙරස්සානුභාවෙන දිස්වා තුට්ඨමානසො නික්ඛමිත්වා සබ්බං මග්ගං පඤ්චවණ්ණෙහි පුප්ඵෙහි ඔකිරන්තො අන්තරන්තරා පුප්ඵග්ඝියානි ඨපෙන්තො එකාහෙනෙව ජම්බුකොලපට්ටනං ගන්ත්වා සබ්බතාලාවචරපරිවුතො පුප්ඵධූපගන්ධාදීහි පූජයමානො ගලප්පමානං උදකං ඔරුය්හ ආගතො වත රෙ දසබලස්ස සරසරංසිජාලං විස්සජ්ජනකො බොධිරුක්ඛොති පසන්නචිත්තො මහාබොධිං උක්ඛිපිත්වා උත්තමංගෙ සිරස්මිං පතිට්ඨපෙත්වා මහාබොධිං පරිවාරෙත්වා ආගතෙහි සොළසහි ජාතිසම්පන්නකුලෙහි සද්ධිං සමුද්දතො පච්චුත්තරිත්වා සමුද්දතීරෙ බොධිං ඨපෙත්වා තීණි දිවසානි සකලතම්බපණ්ණිරජ්ජෙන පූජෙසි. අථ චතුත්ථෙ දිවසෙ මහාබොධිං ආදාය උළාරං පූජං කුරුමානො අනුපුබ්බෙන අනුරාධපුරං සම්පත්තො අනුරාධපුරෙපි මහාසක්කාරං කත්වා චාතුද්දසී දිවසෙ වඩ්ඪමානකච්ඡායාය මහාබොධිං උත්තරද්වාරෙන පවෙසෙත්වා නගරමජ්ඣෙන අතිහරිත්වා දක්ඛිණද්වාරෙන නික්ඛමිත්වා දක්ඛිණද්වාරතො පඤ්චධනුසතිකෙ ඨානෙ යත්ථ අම්හාකං සම්මා සම්බුද්ධො නිරොධසමාපත්තිං සමාපජ්ජිත්වා නිසිදි, පුරිමකා ච තයො සම්මා සම්බුද්ධා සමාපත්තිං අප්පෙත්වා නිසීදිංසු. යත්ථ ච කකුසන්ධස්ස භගවතො සිරීසබොධි කොණාගමනස්ස භගවතො උදුම්බරබොධි කස්සපස්ස භගවතො නිග්‍රොධබොධි පතිට්ඨාසි, තස්මිං මහමෙඝවනුය්‍යානස්ස තිලකභූතෙ කතභූමිපරිකම්මෙ රාජවත්ථුද්වාරකොට්ඨකට්ඨානෙ මහාබොධිං පතිට්ඨාපෙසි.

(බොධිආගමනකථා - ථූපවංසො)

## පද මාලාව

| | | | |
|---|---|---|---|
| **මහාරාජාපි** | **(ස)** | - | මහරජු ද |
| **උත්තරද්වාරතො** | **(ස)** | - | උතුරු දොරටුවෙන් |
| **පට්ඨාය** | **(පූ.ක්‍රි)** | - | පටන් |
| **ජම්බුකොලපට්ටනා** | **(ස)** | - | දඹකොළපටුන (දක්වා) |
| **සොධාපෙත්වා** | **(පූ.ක්‍රි)** | - | පිරිසිදු කරවා |
| **අලඞ්කාරාපෙත්වා** | **(පූ.ක්‍රි)** | - | අලංකාර කරවා |
| **නික්ඛමනදිවසෙ** | **(ස)** | - | නික්මෙන දිනයෙහි |
| **උත්තරද්වාරසමීපෙ** | **(ස)** | - | උතුරු දොරටුව ළඟ |
| **සමුද්දසාලාවත්ථුස්මිං** | **(ස)** | - | සමුද්‍ර ශාලා |
| **මහාසමුද්දෙ** | **(ස)** | - | මහමුහුදෙහි |
| **ථෙරස්සානුභාවෙන** | **(ස)** | - | තෙරුන්ගේ අනුහසින් |

| | | | |
|---|---|---|---|
| **විභූතියා** | **(නා)** | - | අලංකාරයෙන් |
| **තුට්ඨමානසො** | **(ස)** | - | සතුටු සිතැත්තේ |
| **නික්ඛමිත්වා** | **(පූ.ක්‍රි)** | - | නික්මී |
| **පඤ්චවණ්ණෙහි** | **(ස)** | - | වර්ණ පහකින් යුතු |
| **පුප්ඵෙහි** | **(නා)** | - | මල්වලින් |
| **ඔකිරන්තා** | **(කි)** | - | ඉසිමින් |
| **අන්තරන්තරා** | **(ස)** | - | තැනින් තැන (අතරතුර) |
| **පුප්ඵගච්ඡියානි** | **(ස)** | - | මල් ඇගෑ |
| **එකාහෙනෙව** | **(ස)** | - | එක්දිනකින්ම |
| **ජම්බුකොලපට්ටනං** | **(ස)** | - | දඹකොළපටුන |
| **සබ්බතාලාවචරපරිවුතො** | **(ස)** | - | සියලු තූර්යනාදයන් පිරිවරණ ලද |
| **පුප්ඵධූපගන්ධාදීහි** | **(ස)** | - | මල් සුවඳදුම් ආදියෙන් |
| **පූජයමානො** | **(කි)** | - | පුදනු ලබන්නේ |
| **ගලප්පමාණං** | **(ස)** | - | ගෙළ දක්වා |
| **ඔරුය්හ** | **(පූ.ක්‍රි)** | - | බැස |
| **දසබලස්ස** | **(ස)** | - | බුදුරදුන්ගේ |
| **සරසරංසිජාලං** | **(ස)** | - | හාත්පස රස්මිජාලය |
| **විස්සජ්ජනකො** | **(කි)** | - | විහිදුවන |
| **පසන්නචිත්තො** | **(ස)** | - | පැහැදුණු සිතැත්තේ |
| **උක්ඛිපිත්වා** | **(පූ.ක්‍රි.)** | - | ඔසවා |
| **උත්තමඞ්ගෙ** | **(ස.)** | - | හිසෙහි |
| **පරිවාරෙත්වා** | **(පූ.ක්‍රි)** | - | පිරිවරා |
| **ආගතෙහි** | **(කි)** | - | ආවා වූ |
| **සොළසහි** | **(නා)** | - | දහසයක් |
| **ජාතිසම්පන්නකුලෙහි** | **(ස)** | - | ජාතියෙන් යුතු කුලයන් සමග |
| **පච්චුත්තරිත්වා** | **(පූ.ක්‍රි)** | - | ගොඩවී |
| **සමුද්දතීරෙ** | **(ස)** | - | මුහුදුතෙර |
| **කුරුමානො** | **(කි)** | - | කරන්නේ |
| **අනුපුබ්බෙන** | **(ස)** | - | අනුපිළිවෙලින් |
| **මහාසක්කාරං** | **(ස)** | - | මහත් සත්කාර |
| **චාතුද්දසී දිවසෙ** | **(ස)** | - | තුදුස්වක් දිනයෙහි |
| **වඩ්ඪමානකච්ඡායාය** | **(ස)** | - | සවස (සෙවනැල්ල වැඩෙන කාලයේ) |
| **උත්තරද්වාරෙන** | **(ස)** | - | උතුරු දොරටුවෙන් |
| **දක්ඛිණද්වාරෙන** | **(ස)** | - | දකුණු දොරටුවෙන් |
| **පඤ්චධනු සතිකෙ ඨානෙ** | **(ස)** | - | දුනු පන්සියයක් දුර තැන |
| **නිරොධසමාපත්තිං** | **(ස)** | - | නිරෝධසමාපත්තියට |
| **පුරිමකා** | **(ත)** | - | පෙර සිටි |
| **අප්පෙත්වා** | **(පූ.ක්‍රි)** | - | පැමිණ (සමවැදී) |
| **කතභූමිපරිකම්මෙ** | **(ස)** | - | කරන ලද භූමි පරිකර්ම ඇති (සැකසූ බිම ඇති) |
| **රාජවත්ථුද්වාරකොට්ඨකට්ඨානෙ** | **(ස)** | - | රාජ වස්තු තැන්පත් කෝෂ්ඨාගාරය පිහිටි තැන |



*නොමිලේ බෙදා හැරීම පිණිසයි*

| | | | |
|---|---|---|---|
| **සිරීසබොධි** | (ස) | - | මහරි බෝධිය |
| **උදුම්බරබොධි** | (ස) | - | දිඹුල් බෝධිය |
| **නිග්‍රොධබොධි** | (ස) | - | නුග බෝධිය |

**අභ්‍යාස**

1. 'මහා බොධිපතිට්ඨාපනං' යන ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. දෙවානම්පියතිස්සො රාජා කිත්තමාණං මග්ගං සොධාපෙසි ?
ii. සමුද්දතීරෙ බොධිං ඨපෙත්වා කති දිවසානි පූජෙසි ?
iii. මහාබොධිං පරිවාරෙත්වා කති ජාතිසම්පන්නා කුලා ආගච්ඡිංසු ?
iv. රාජා මහාබොධිං චාතුද්දසීදිවසෙ කස්මිං සමයෙ රාජවත්ථුද්වාරකොට්ඨකෙ පතිට්ඨාපෙසි ?
v. කො මහාබොධියා තම්බපණ්ණිරජ්ජෙන පූජෙසි ?

3. පහත ප්‍රශ්නවලට ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

i. සමුද්දසාලාවත්ථු යන්න පැහැදිලි කරන්න.
ii. තිස්ස රජුට අනුරාධපුර සිට දඹකොළ පටුනට යාමට කොපමණ කලක් ගතවීද ?
iii. ගෞතම බුදුන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැද සිටියේ බෝධියට කවර දිසාවක කොපමණ දුරක ද ?
iv. පෙර කවර බුදුවරුන්ගේ කවර බෝධීන් වහන්සේලා ශ්‍රී මහා බෝධිය පිහිටි තැන පිහිටුවා තිබුණි ද?
v. අනුරපුරයෙහි මහාබෝධිය පිහිට වූයේ දවසේ කවර වෙලාවේද ?

## සමාස හැඳින්වීම

නාමපද දෙකක් හෝ ඊට වැඩිගණනක් එක්කොට එක පදයක් බවට පත්කිරීම සමාස නම් වේ. නාමපදයක් ක්‍රියාපදයක් සමග කිසිවිටෙක සමාස නො වෙයි. **"නාමානං සමාසො යුත්තත්ථො"** යනුවෙන් අර්ථවත් නාමයන් නිසි පරිදි ගැළපීම සමාස නම් වේ.

**සමාස පදවල ප්‍රධාන ලක්ෂණ**

| | | |
|---|---|---|
| පද කෙටිවීම | - | සමාසො පදසංඛෙපො |
| එක් පදයක් බවට පත්වීම | - | එකපදත්තා සංයුත්තං |
| එක්ව උච්චාරණය | - | එකොච්චාරණතො යුතං |
| එක් විභක්තියක් වීම | - | එකවිභත්තිතා යුත්තං |

**සමාස තුළින් ලැබෙන ප්‍රයෝජන**

ව්‍යක්තබව ඇතිවීම.
මටසිලිටිබව ඇතිවීම.
උච්චාරණයට පහසුවීම.
ලිවීමට පහසුවීම.

**සමාසප්‍රභේද**

සමාස නාමයන්ගේ ලක්ෂණ හා සමාස වූ පසු දක්නට ලැබෙන ලක්ෂණ අනුව කොටස් හයකට බෙදෙයි.

| | |
|---|---|
| කම්මධාරය සමාසය | **'දවිපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො'** |
| දිගු සමාසය | **'සංඛ්‍යා පුබ්බො දිගු'** |
| තප්පුරිස සමාසය | **'අමාදයො පරපදෙහි'** |
| ද්වන්ද සමාසය | **'නාමානං සමුච්චයො ද්වන්දො'** |
| බහුබ්බීහි සමාසය | **'අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි '** |
| අව්‍යයීභාව සමාසය | **'උපසග්ගනිපාතපුබ්බකො අව්‍යයීභාවො'** |

**කම්මධාරය සමාසය**

**'දවිපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො'**. සෑමවිටම පරපදය ප්‍රධාන අතර විශේෂණ පද විශේෂ්‍ය පද සමග සමාස වෙයි. ලිංග, විභක්ති, වචන නාම පදයක දක්නට ලැබෙන ලක්ෂණයි. එය අධිකරණ නම් වේ. නාම යුගලයක් ඉහත කී ලිංග වචන විභක්තිවලින් සමාන නම් එය තුල්‍යාධිකරණ යයි. අසමාන නම් එය භින්නාධිකරණ යයි.

කම්මධාරය සමාසයේ ප්‍රභේද 09 කි.

i. **විසෙසන පුබ්බපද**
ii. **විසෙසන උත්තරපද**
iii. **විසෙසන උභයපද**
iv. **උපමානොත්තරපද**
v. **සම්භාවනා පුබ්බපද**
vi. **අවධාරණ පුබ්බපද**
vii. **න නිපාත පුබ්බපද**
viii. **කු නිපාත පුබ්බපද**
xi. **ප ආදී නිපාත පුබ්බපද**

**විශේෂණ පුබ්බපද කම්මධාරය සමාසය**

විශේෂණ පද මුලිනුත් විශේෂ්‍ය පද අගිනුත් යොදයි.

උදා:- **නීලං ච තං උප්පලං - නීලුප්පලං (නිල් උපුල්)**
**බ්‍රාහ්මණී ච සා දාරිකා - බ්‍රාහ්මණදාරිකා (බමුණු දැරිය)**
**කණ්හො ච සො සප්පො - කණ්හසප්පො (කලු සර්පයා)**

**විශේෂණ උත්තරපද කම්මධාරය සමාසය**

විශේෂ්‍ය පද මුලිනුත් විශේෂණ පද පසුවත් යෙදෙයි.

උදා:- ආචරියො ච සො ගුත්තිලොචාති - ගුත්තිලාචරියො (ඇදුරු ගුත්තිල)
මහාකස්සපො ච සො ථෙරොචාති - මහාකස්සපත්ථෙරො (මහාකස්සප තෙරුන්)
සාරිපුත්තො ච සො ථෙරොචාති - සාරිපුත්තත්ථෙරො (සැරියුත් තෙරුණුවෝ)

**විශේෂණ උභයපද කම්මධාරය සමාසය**

මෙහි දී පද දෙකම විශේෂණ වී යෙදෙයි.

උදා:- අන්ධො ච සො බධිරො - අන්ධබධිරො (අඳ බිහිරි)
සීතං ච තං උණ්හං - සීතුණ්හං (සීතල ද උණුසුම ද)
ඡින්නං ච තං භින්නං - ඡින්නභින්නං (සිඳුණු බිඳුණු)

**උපමානොත්තරපද කම්මධාරය සමාසය.**

උපමේය පදය මුලිනුත් උපමාන පදය අගිනුත් යෙදෙයි.

උදා:- චන්දො විය මුඛං - මුඛචන්දො (සඳ වැනි මුහුණ)
නාගො විය බුද්ධො - බුද්ධනාගො (ඇතෙකු වැනි බුදුරජු )
සීහො විය මුනි - මුනිසීහො (සිංහයෙකු වැනි මුනිවරයා)

**සම්භාවනා පුබ්බපද කම්මධාරය සමාසය**

සම්භාවනාවට ලක්වන 'ඉති' පදය යොදා එය ලොප් කොට ගලපන සමාසය.

උදා:- ධම්මො ඉති බුද්ධි - ධම්මබුද්ධි (ධර්මය බුද්ධිය)
අත්තා ඉති දිට්ඨි - අත්තදිට්ඨි (ආත්ම දෘෂ්ටිය)
අනිච්ච ඉති සඤ්ඤා - අනිච්චසඤ්ඤා (අනිත්‍ය සංඥාව)

**අවධාරණ පුබ්බපද කම්මධාරය සමාසය**

අවධාරණයට ලක් වන "එව" පදය ලොප්කොට ගලපන සමාසය.

උදා:- සීලං එව ධනං - සීලධනං (සීලධනය)
ගුණො එව ධනං - ගුණධනං (ගුණධනය)
සද්ධා එව ධනං - සද්ධාධනං (ශ්‍රද්ධාධනය)

**න නිපාත පුබ්බපද කම්මධාර සමාසය.**

'න' නිපාත පදය විශේෂණ වශයෙන් යෙදී ගලපන සමාසය.

උදා:- න සුරො - අසුරො (අසුර)
න බ්‍රාහමණො - අබ්‍රාහමණො (බමුණෙකු නොවන)
න අරියෝ - අනරියො (ආර්ය නොවූ)

**'කු' නිපාත පුබ්බපද කම්මධාර සමාසය.**

'කු' නිපාතය විශේෂණ වශයෙන් යෙදී ගලපන සමාසය.

උදා:- කු පුරිසො - කාපුරිසො (නින්දිත පුරුෂයා)
කු දිට්ඨි - කුදිට්ඨි (වැරදි දෘෂ්ටිය)
කු දාරා - කුදාරා (නින්දිත ගැහැණිය)

**'ප' ආදී නිපාත කම්මධාරය සමාසය.**

'ප' ආදී නිපාත මුලට යෙදේ.

උදා:- ප වචනං - පාවචනං (බුද්ධ වචනය)
අධි සීලං - අධිසීලං (අධිසීලය)
සු ගන්ධා - සුගන්ධො (සුවඳ)

## දිගු සමාසය

සංඛ්‍යා වාචී පදයක් මුලට යෙදී සිදුවන සමාසයයි. **'සංඛ්‍යා පුබ්බො දිගුති'** යන සූත්‍රයෙන් එය දැක්වේ. මෙහි ප්‍රභේද දෙකකි.

සමාහාර දිගු
අසමාහාර දිගු

**සමාහාර දිගු සමාසය**

පද සමාස වූ පසු නිත්‍ය ඒකවචන හා නපුංසකලිංග වන පදයි.

උදා:- චතස්සො දිසා - චතුද්දිසං (සතර දිශාව)
චත්තාරි සච්චානි - චතුසච්චං (සත්‍ය සතර)
තයො ලොකො - තිලොකං (තුන්ලොව)

**අසමාහාර දිගු සමාසය**

පද සමාස වූ පසු ලිංගත්‍රයේ හා ඒකවචන බහුවචනයන්හි යෙදෙයි.

උදා:- චතස්සො දිසා - චතුද්දිසා (සතර දිශාව)
තයො භවා - තිභවා (තුන්භවය)
එකො ච සො ධම්මො - එකධම්මො (එක් දහමක්)

## තප්පුරිස සමාසය

දුතියා විභක්තියේ සිට සත්තමී විභක්තිය දක්වා නාමයකට පරව තවත් පදයක් එක් වී සිදුවන සමාසය තප්පුරිස සමාසයයි. **අමාදයො පරපදෙහි** යනුවෙන් 'අං' ආදී විභක්ත්‍යර්ථවත් පද සමඟ යෙදෙන බව දක්වා ඇත.

**දුතියා විභත්ති තප්පුරිස සමාසය**

උදා:- ගාමං ගතො - ගාමගතො (ගමට ගියේ)
ධම්මං නිස්සිතො - ධම්මනිස්සිතො (ධර්මය ආශ්‍රිත වූයේ)
අරඤ්ඤං ගතො - අරඤ්ඤගතො (කැලයට ගියේ)

**තතියා විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | බුද්ධෙන දෙසිතො | - බුද්ධදෙසිතො | (බුදුන් විසින් දෙසන ලද) |
| | රාගෙන පීළිතො | - රාගපීළිතො | (රාගයෙන් පෙළුනේ) |
| | ගුණෙහි වුද්ධො | - ගුණවුද්ධො | (ගුණයෙන් වෘද්ධ) |

**චතුත්ථි විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | පාසාදාය දබ්බං | - පාසාදදබ්බං | (පහයට ද්‍රව්‍ය) |
| | කඨිනාය දුස්සං | - කඨිනදුස්සං | (කඨිනය පිණිස රෙදි) |
| | සංඝස්ස භත්තං | - සංඝභත්තං | (භික්ෂූන්ට දෙන දානය) |

**පඤ්චමී විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | රුක්ඛග්ගා පතිතො | - රුක්ඛග්ගපතිතො | (අතු අගින් වැටුණු) |
| | චොරස්මා භයං | - චොරභයං | (සොරුගෙන් වන බිය) |
| | නගරා නිග්ගතො | - නගරනිග්ගතො | (නුවරින් පිටවූයේ) |

**ඡට්ඨී විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | ජිනස්ස වචනං | - ජිනවචනං | (බුදුන්ගේ වචනය) |
| | බුද්ධස්ස සාවකො | - බුද්ධසාවකො | (බුදුන්ගේ ශ්‍රාවකයා) |
| | රුක්ඛස්ස මූලං | - රුක්ඛමූලං | (ගස්මුල්) |

**සත්තමී විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | වනෙ මහිසො | - වනමහිසො | (වනයෙහි මීමා) |
| | ගාමෙ සූකරො | - ගාමසූකරො | (ගමෙහි ඌරා) |
| | ධම්මෙ රතො | - ධම්මරතො | (ධර්මයෙහි ඇලුණු) |

## ද්වන්ද සමාසය

සමාන විභක්ති ඇති නාමපද දෙකක් හෝ කිහිපයක් එක් කිරීමෙන් සෑදෙන සමාස ද්වන්ද සමාසය නම් වේ. (නාමානං සමුච්චයො ද්වන්දො) මෙහිදී ච යන නිපාතයෙන් පද එකිනෙක සම්බන්ධ වෙයි. මෙහි ප්‍රභේද දෙකකි.

සමාහාර ද්වන්ද
ඉතරීතර යෝග ද්වන්ද

**සමාහාර ද්වන්ද**

පදයන් සමාස වූ පසු නිත්‍ය බහු වචනයෙන් සිටී.

| | | | |
|---|---|---|---|
| උදා:- | චන්දො ච සූරියො ච | - චන්දසූරියා | (සඳහිරු) |
| | සමණා ච බ්‍රාහමණා ච | - සමණබ්‍රාහමණා | (ශ්‍රමණ බ්‍රාහ්මණයෝ) |
| | මාතා ච පිතා ච | - මාතාපිතරො | (මව්පියෝ) |

**ඉතරීතරයෝග දවන්ද**

පදයක් සමාස වූ පසු නිත්‍ය ඒකවචන නපුංසක ලිංග වෙයි.

| | | |
|---|---|---|
| උදා:- මුඛං ච නාසිකා ච | - මුඛනාසිකං | (මුහුණ ද නහය ද) |
| පුබ්බා ච අපරා ච | - පුබ්බාපරං | (පෙර දිග ද අපරදිග ද) |
| හත්ථිනො ච අස්සා ච | - හත්ථස්සං | (ඇත්තු ද අශ්වයෝ ද) |

## බහුබ්බීහි සමාසය

සමාස වූ පසු එහි අර්ථය හැර වෙනත් අර්ථයක් ලැබෙන සමාසය මෙනමින් හැඳින්වේ. අඤ්ඤපදත්ථෙසු බහුබ්බී'හි දුතියා විභක්තියේ සිට සත්තමී විභක්තිය දක්වා විභක්තිවල මෙම සමාසය සිදුවෙයි.

**දුතියා විභත්ති බහුබ්බීහි සමාසය**

| | | |
|---|---|---|
| ආරූළ්හා වානරො යං සො | - ආරූළ්හවානරො | (ගස) |
| ආගතා සමණා යං සො | - ආගතසමණො | (විහාරය) |
| ආරූළ්හා වාණිජා යං සො | - ආරූළ්හවාණිජො | (නැව) |

**තතියා විභත්ති බහුබ්බීහි සමාසය**

| | | |
|---|---|---|
| විජිතා මාරා යෙන සො | - විජිතමාරො | (බුදුරජ) |
| ජිතානි ඉන්ද්‍රියානි යෙන සො | - ජිතින්ද්‍රියො | (මුනි) |
| දිට්ඨො ධම්මො යෙන සො | - දිට්ඨධම්මො | (බුද්ධශ්‍රාවක) |

**චතුත්ථී විභත්ති බහුබ්බීහි සමාසය**

| | | |
|---|---|---|
| උපනීතං භොජනං යස්ස සො | - උපනීතභොජනො | (දුගී) |
| දින්නො සුංකො යස්ස සො | - දින්නසුංකො | (රජු) |
| උපහටො බලි යස්ස සො | - උපහටබලි | (ප්‍රේත) |

**පඤ්චමී විභත්ති බහුබ්බීහි සමාසය**

| | | |
|---|---|---|
| අපෙතං විඤ්ඤාණං යස්මා සො | - අපෙතවිඤ්ඤාණො | (මළසිරුර) |
| නිග්ගතො අයො යස්මා සො | - නිරයො | (නිරය) |
| නිග්ගතා ජනා යස්මා සො | - නිග්ගතජනො | (ගම) |

**ඡට්ඨි විභත්ති බහුබ්බීහි සමාසය**

| | | |
|---|---|---|
| තිස්සො විජ්ජා යස්ස සො | - තෙවිජ්ජො | (බුදුරදුන්) |
| චත්තාරො පාදා යස්ස සො | - චතුප්පදො | (සිවුපා) |
| ඛීණා ආසවා යස්ස සො | - ඛීණාසවො | (කෙළෙස් රහිත) |

**සත්තමි විභත්ති බහුබ්බීහි සමාසය**

| | | |
|---|---|---|
| බහවො සාමිකා යස්මිං තං | - බහුසාමිකං | (නගරය) |
| බහු ජම්බු යස්මිං තං | - බහුජම්බුකං | (වනය) |
| ආකිණ්ණා මනුස්සා යස්මිං සො | - ආකිණ්ණමනුස්සො | (රාජධානිය) |

## අව්‍යයීභාව සමාසය

නිපාත හා උපසර්ග යන අව්‍ය පදයන් මුල්වී සිදුවන සමාසය අව්‍යයීභාව සමාසයයි. **"උපසගගනිපාතපුබ්බතො අව්‍යයීභාවො"** යනුවෙන් ඒ බව දැක්වේ. අව්‍යයිභාව සමාසය නපුංසක ලිංග ඒකවචන වේ. නිපාත හෝ උපසර්ග පදය යෙදෙන ආකාරය අනුව අර්ථ සමූහයක යෙදේ.

**සමීපාර්ථය.**
නගරස්ස සමීපං - උපනගරං (නුවර සමීපය)
**අභාවාර්ථ.**
දරථානං අභාවො - නිද්දරථං (විඩාව නැති)
**පශ්චාදර්ථය.**
වාතස්ස අනු - අනුවාතං (යටි සුළඟ)
**යොගාර්ථය.**
ගන්ධස්ස අනු - අනුගන්ධං (සුවඳට සුදුසු)
**විප්සාර්ථය.**
අද්ධමාසං අනු - අන්වද්ධමාසං (අඩ මසක් පාසා)
**අනුපූර්වාර්ථය.**
ථෙරානං අනුපුබ්බො - අනුථෙරං (තෙරුන්ගේ පිළිවෙළ)
**ප්‍රතිලෝමාර්ථය.**
වාතස්ස පටි - පටිවාතං (උඩු සුළඟ)
**සමෘද්ධාර්ථය.**
භික්ඛාය සමිද්ධිං - සුභික්ඛං (ආහාර සුලබ)
**මර්දායාර්ථය.**
පාණකොටි යාව - ආපාණකොටිං (දිවි ඇතිතාක්)
**නිපාත පූර්වක**
නගරම්හා බහි - බහිනගරං (නුවරින් පිට)

**අභ්‍යාස**

(1) පහත සදහන් අසමස්ත පද සමාස කර සමාසය නම් කරන්න.

i. මහන්තො රාජා
ii. ජම්බුකොළ නාම පට්ටනං
iii. ථෙරස්ස ආනුභාවෙන
iv. පඤ්චහි වණ්ණෙහි
v. තුට්ඨමානසො යස්ස සො
vi. එකෙන අහෙන
vii. දසබලානි යස්ස සො
vii. සොළසෙහි කුලෙහි
ix. තීණි දිවසානි
x. මහතී බොධි

(2) සමාසපද විග්‍රහ කොට සමාසය නම් කරන්න.

i. නගරමජ්ඣෙ
ii. මහාසමුද්දෙ
iii. අන්තරාමග්ගෙ
iv. පුප්ඵගන්ධියානි
v. පුප්ඵධූපානි
vi. ගලප්පමාණං
vii. ජාතිසම්පන්නො
viii. තම්බපණ්ණිරජ්ජං
ix. අනුපුබ්බෙන
x. දක්ඛිණද්වාරං
xi. උදුම්බරබොධිං

(3) සුදුසු සමාසපද යොදා වාක්‍යය සම්පූර්ණ කර තේරුම් ලියන්න.

පුනදිවසෙ, දසබලස්ස, ආගමනමග්ගං, මහාදානං, මහාමහින්දත්ථෙරො, චුල්ලහත්ථිපදොපමසුත්තං, ලඞ්කාවාසීනං, මහාබොධියා, මහාසක්කාරං, ලංකාවාසිනො, එකාහෙනෙව, ජයමහාබොධිං, පසන්නමානසො, ඛීණාසවො, පඨමමහාධම්මසංගීතිං

i. --------------------මනුස්සා --------- -------------- අලංකරිත්වා ---------- සජ්ජෙසුං.
ii. --------- -------------- ආසාළ්හපුණ්ණමදිවසෙ නභසා ආගන්ත්වා ------------ ------------- දෙසෙසි.
iii. තතො පට්ඨාය ------------ සොගතා ජනා ------------ ----------- අකංසු.
iv. දෙවානම්පියතිස්ස මහාරාජා ------------ ජම්බුකොලපට්ඨනං ගන්ත්වා ---------- දිස්වා -------- අහොසි.
v. -----------මහාකස්සපො ------------- රාජගහෙ සත්තපණ්ණිගුහාද්වාරෙ අකාසි.

(4) පහත සඳහන් වාක්‍ය පාලියට පරිවර්තනය කරන්න.

i. පිණ්ඩෝල භාරද්වාජ හිමියෝ අහසින් ගොස් පාත්‍රය ගත්හ.
ii. දේවානම්පියතිස්ස රජතුමා මහාමහින්ද තෙරුන්ගේ ධර්මය අසා බුද්ධශ්‍රාවකයෙක් විය.
iii. බුදුන් වහන්සේ සත්දිනක් අනුපිය අඹ වනයෙහි විසූ සේක.
iv. වෙළෙන්දා ආයුධයක් ගෙන දොරටුපාලයාට පහර දුන්නේය.
v. බරණැස් මහරජ බැණාට ස්වකීය දූ කුමරිය දී රාජ්‍යයෙහි අභිෂේක කරවීය.

(5) පිළිතුරු ලියන්න.
i. සමාස වර්ග කීයද ? ඒ මොනවාද?
ii. සමාසවල ප්‍රයෝජන කවරේද?
iii. 'මහාබොධිපතිට්ඨාපනං' ඡේදයේ එන සමාසපද 10ක් උපුටා වර්ග කරන්න.
iv. පහත සඳහන් පද වාක්‍යවල යොදන්න.
පච්ඡාභත්තං, යාවජීවං, ජිනවචනං, ගුත්තිලාචරියො, චොරභයං



නොමිලේ බෙදා හැරීම පිණිසයි